# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** - **වැඩබලන සහකාර වතු අධිකාරීවරුන්**

**සුදුසුකම්** - වැවිලි පුහුණුව/ අභ්‍යාසලාභී වැවිලිකරු සඳහා වන මාස 09 ක පුහුණු කාලය හදාරා පහත සඳහන් සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයන්

- අ.පො.ස (උ/ පෙළ) විභාගයේ ජෛව පද්ධති තාක්ෂණය හෝ ජෛව විද්‍යා විෂය ධාරාවේ එක් වරකදී ඕනෑම විෂයන් තුනක් (සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සඳහා "S" සාමාර්ථයක් ලබා තිබීම

  **හෝ**

- අ.පො.ස (උ/ පෙළ) විභාගයේදී එක්වර ඕනෑම විෂය ධාරාවක ඕනෑම විෂයන් තුනක් (සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සඳහා "S" සාමාර්ථ ලබා තිබීම සමග විධායක ශ්‍රේණියේ තනතුරක වැවිලි කර්මාන්තයට සම්බන්ධ අංශයක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

  **හෝ**

- ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් පවත්වනු ලබන වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ වැවිලි කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව

  **හෝ**

- ශ්‍රී ලංකාවේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සහතික කරන වැවිලි භෝග තාක්ෂණය හෝ වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)5 හෝ 6 මට්ටමේ සුදුසුකම

  **හෝ**

- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය සභාවට පිළිගත හැකි ඉහත 4 හි සඳහන් ක්ෂේත්‍රයට අදාලව උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පිරිනමනු ලබන ඕනෑම වෙනත් ඩිප්ලෝමාවක්.

  **හෝ**

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය විසින් පිරිනමනු ලබන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ ඩිප්ලෝමාව

  **හෝ**

- කෘෂි කර්මයට අදාළ පිළිගත් ආයතනයක් (තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් අනුමත කරන ලද ආයතනයක්) විසින් පිරිනමන අවම වශයෙන් මාස 12 ක කාලසීමාවක් තුළදී නිමවන ඕනෑම වෙනත් ඩිප්ලෝමාවක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්දක්

  **හෝ**

- ජෛව විද්‍යාව හෝ ජෛව පද්ධති තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ ගණිතය හෝ වාණිජය යන විෂය ධාරාවන්ගෙන් කුමන හෝ විෂය ධාරාවක් යටතේ සිදුකළ අ.පො.ස (උ පෙළ) විභාගයේදී හෝ Edexel උසස් පෙළ විභාගයේදී හෝ කේම්බ්‍රිජ් උසස් පෙළ විභාගයේදී සාමාර්ථ තුනක් (03) සමග අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක (03) සේවා පළපුරුද්ද.

  **හෝ**

- අ.පො.ස. (සා/ පෙළ) විභාගයේදී ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන් සඳහා සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම හා අ.පො.ස. (උ/ පෙළ) විභාගයේදී සාමාර්ථ තුනක් (03) (ඕනෑම විෂය ධාරාවකින්) ලබා තිබීම.

  **හෝ**

- අ.පො.ස (සා/ පෙළ) විභාගයේදී දෙකකට (02) නොවැඩි වාර ගණනකදී ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි සහිතව විෂයන් හයකින් (06) සමත් වීම සමග වැවිලි/ කෘෂිකර්ම යන අංශයන්ට අදාළව වසර දෙකක (02) පළපුරුද්ද.

  **හෝ**

- පිළිගත් ආයතනයකින් (තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද) කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**අතිරේක ප්‍රතිලාභ** - බාහිර හා අභ්‍යන්තර වෛද්‍ය රක්ෂණාවරණ හිමිකම, සේවක අර්ථ සාධක අරමුදලට හෝ ලංකා වැවිලි කරුවන්ගේ අර්ථ සාධක සමිතියට සේවක වැටුපෙන් 10% ක අවම දායකත්වයක් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් අර්ථ සාධක අරමුදලට 12% ක හා සේවක භාරකාර අරමුදලට 3% ක දායකත්වය.

අධීක්ෂණ කටයුතු සඳහා යතුරු පැදියක් හෝ දීමනාවක් සහ ඉන්ධන කෝටාවක් ලබා දෙනු ලැබේ.

ගෘහ භාණ්ඩ සහිත බංගලාවක් සමග එක් බාහිර සහ එක් අභ්‍යන්තර කම්කරුවෙකු සඳහා දීමනාවක් ලබා දෙනු ලැබේ.

**වැටුප් පරිමාණය** - මාසිකව රු. 45,000/= ක් ගෙවනු ලැබේ.

**වයස** - අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 30 ට වැඩි නොවිය යුතුය.

**අනෙකුත්** - සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

මෙම තනතුරේ කාර්යයන් මනා ලෙස ඉටු කිරීම සඳහා සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.

සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.

අවශ්‍ය අවශ්‍යතා සපුරාලන සාර්ථක අපේක්ෂකයන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ඇබෑර්තු තිබෙන පරිදි සහකාර වතු අධිකාරි තනතුරට බඳවා ගනු ලැබේ.

**අයදුම්පත්** - අයදුම්කරුවන් සියලු විස්තර ඇතුළත් ස්වකීය අයදුම්පත් උප්පැන්න, අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග, අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අයදුම්පත් භාරගන්නා වූ අවසාන දිනය** - අයදුම්පත්, 2023 ඔක්තෝබර් 27 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය.

**සභාපති, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**

**අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10.**

**2023.10.09**